Lanka Salt Ltd.
ISO 9001,22000 Certified Company
*Committed to the freedom from brain damage with iodized salt*

# ලංකා ලුණු සමාගම

## ඇබෑර්තු

SLS හා ISO 9001:22000 ප්‍රතිතතලත්, රටෙහි විශාලතම ලුණු නිෂ්පාදකයා වන ලංකා ලුණු සමාගම (LSL) සඳහා එහි පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා යථා පරිදි සුදුසුකම්ලත් තමන්ගේ තමන්ගේ සේවය ලබාදීමට කැමති අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සෑම අයදුම්කරුවකු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර, තනතුරට අදාළ රාජකාරි නිසි අයුරු ඉටුකිරීම සඳහා මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතු මෙන්ම විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුසුම අයදුම්කරුවන්, අදාළ ක්ෂේත්‍රවල ප්‍රසිද්ධ ආයතනවල පෙර පළපුරුද්ද සතු අය විය යුතු අතර, ඔහු/ ඇය. පරීක්ෂාශීලී ප්‍රගාමී හා බුද්ධිමත් අය විය යුතුය.

## සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු හා නඩත්තු HM1-3

**රැකියා විස්තරය/ ප්‍රධාන වගකීම් ක්ෂේත්‍ර :**

දෙපාර්තමේන්තුවට නායකත්වය ලබාදෙමින්, ඉංජිනේරු හා නඩත්තු ක්‍රියාකාරකම්වල සුමට මෙහෙයුම් කටයුතු උදෙසා පැහැදිලි මාර්ගෝපදේශ හා උපදෙස් ලබාදිය යුතුය.

**ප්‍රධාන ප්‍රතිඵල අවශ්‍ය ක්ෂේත්‍ර :**

- පහත සඳහන් ප්‍රධාන ප්‍රතිඵලදායී ක්ෂේත්‍රවල කටයුතු සිදු කිරීමට අංශ ප්‍රධානී වෙත සහාය විය යුතුය.
- ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සුමට මෙහෙයුම් සහතික විය යුතුය.
- අංශ ප්‍රධානී (නිෂ්පාදන) සමග උපදේශකත්වයෙන් කටයුතු කරමින් සියලුම අලුත්වැඩියා හා තාක්ෂණ ගැටලු සම්බන්ධයෙන් කළ යුතුය.
- සියලුම යන්ත්‍රසූත්‍ර හා උපකරණ ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වාගත යුතුය.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු/ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයේ BSc උපාධියක් හෝ සමාන සුදුසුකම්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් අදාළ පිළිගත් වෘත්තීය ආයතනයකින් (IESL හෝ සමාන) නිකුත් කළ සාමාජිකත්වය සහිත වරලත් ඉංජිනේරුවරයකු

**සහ**

රාජ්‍ය ආයතනයක රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ සමාගමක/ ආයතනයක, කළමනාකරණ තලයේ සනාථ කළ සේවා වාර්තාවක් සහිතව අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සමග කළමනාකරණ වර්ගීකරණයේ (MM 1-3) තනතුරක අවම වසර 5 ක සතුටුදායක සේවා කාලයක්,

**සහ**

බහු විෂය ක්ෂේත්‍රවල කණ්ඩායම් මෙහෙවීමේ හා දිශානති කිරීමේ සනාථ කළ හැකියාව සහ සමාගමේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා ව්‍යාපෘති හා වෙනත් සම්පත් කළමනාකරණ හැකියාව.

**සේවා ස්ථානය :** ලංකා ලුණු සමාගමේ ප්‍රධාන කාර්යාලය - හම්බන්තොට

**වැටුප් පරිමාණය :** HM 1-3 රුපියල් (86,865 +15X2,270 = 120,915/=)

**වැටුප් තලය :** රුපියල් 86,865/=

**වයස් සීමාව :** අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල, මණ්ඩලවල හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන HM1-3

**රැකියා විස්තරය/ ප්‍රධාන වගකීම් ක්ෂේත්‍ර :**

විගණන අනාවරණයන් හා ක්‍රියාත්මක කිරීම් සම්බන්ධව පසු විපරම් ක්‍රියාකාරකම් සිදුකිරීම.

අදාළ අංශයට නායකත්වය ලබාදිය යුතු අතර, විගණන ක්‍රියාපටිපාටීන් ප්‍රකාරව ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් පෙළඹවිය යුතුය.

**ප්‍රධාන ප්‍රතිඵල දායක ක්ෂේත්‍ර :**

- වාර්ෂික පදනමින් හා කළමනාකරණ විගණන කටයුතු වෙත විශේෂ අවධානය යොමුකරමින් අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.
- සමාගමේ සියලු ගනුදෙනු, එහි මූල්‍ය රෙගුලාසි, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාගමේ වෙළඳ පොළ මෙහෙයුම් මිල යන කරුණුවලට අනුගාමීව සිදුකිරීම සහතික කිරීම.
- පිළිගත් පරිචයන් හා ක්‍රියාපටිපාටීන්වල සිදුවිය හැකි යම් අපගමනයන් පිළිබඳව ඉහළ කළමනාකාරිත්වය වෙත උපදෙස් සැපයිය යුතුය.
- සමාගමේ හොඳ පාලන පරිචයන් පිළිබඳව සහතික වියයුතු අතර, විගණන තොරතුරු සොයාගැනීම් ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

ICA(SL), ACCA, CIMA,CMA පූර්ණ සුදුසුකම් හෝ සමාන සුදුසුකම්

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, ගිණුම්කරණ, මූල්‍ය කළමනාකරණ හෝ කළමනාකරණ ක්ෂෙත්‍රයේ Bcom උපාධියක් ව්‍යාපාර කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ BSc උපාධියක් හෝ CASL, ACCA, CIMA, CMA අන්තර්මධ්‍ය සාමාර්ථය හෝ වෙනත් සමාන සුදුසුකම්.

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සමග අවම වසර 10 ක රාජ්‍ය ආයතනයක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යාවස්ථාපිත මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක කළමනාකරණ තලයේ පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අවශ්‍ය අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සමග තනතුරට අදාළව ගිණුම්කරණ/ විගණන විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ තලයේ (MM 1-3) අවම වසර 5 ක සතුටුදායක සේවා කාලයක්,

**සහ**

බහු විෂය ක්ෂේත්‍රවල කණ්ඩායම් වෙත නායකත්වය හා දිශානතිය ලබාදිය හැකි සනාථ කළ හැකියාව සහ සමාගමේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මානව හා අනෙකුත් අවශ්‍යතා කළමනාකරණය.

**සේවා ස්ථානය :** ලංකා ලුණු සමාගම ප්‍රධාන කාර්යාලය - හම්බන්තොට

**වැටුප් පරිමාණය :** HM 1-3 රුපියල් (86,865 + 15X2,270 = 120,915/=)

**වැටුප් තලය :** රුපියල් 86,865/=

**වයස් සීමාව :** අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

## සහකාර යාන්ත්‍රික ඉංජිනේරු - JM -1-1

**රැකියා විස්තරය/ ප්‍රධාන වගකීම් ක්ෂේත්‍ර :**

සහකාර සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන හා ඉංජිනේරු) ගේ උපදෙස් හා මාර්ගෝපදේශ යටතේ ලංකා ලුණු සමාගමේ නිෂ්පාදන අරමුණු සම්පූර්ණ කිරීම, නඩත්තු කටයුතු සිදුකරමින් සිවිල්, යාන්ත්‍රික, විදුලි හා තාක්ෂණ අංශවල යන්ත්‍ර සූත්‍ර උපකරණ හා පද්ධතිවල අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා කටයුතු කළ යුතුය. එසේම ඔහු විසින් හදිසි බිඳවැටීම් සම්බන්ධව නිෂ්පාදන කටයුතුවලට බාධා ඇති නොවන අයුරින් කටයුතු කළ යුතු අතර, අදාළ සහාය කාර්ය මණ්ඩලය අධීක්ෂණය කරමින් ඔවුනට අවශ්‍ය මාර්ගෝපදේශ සපයමින් වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ඉංජිනේරු (යාන්ත්‍රික/ රථ වාහන) ක්ෂේත්‍රයේ උපාධියක් හෝ සමාන සුදුසුකම්,**

**හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 07 තලයට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**සහ**

රාජ්‍ය ආයතනයක/ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක/ සමාගමක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතුය.

**අභ්‍යන්තර / අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබාතිබීම.

**හෝ**

යාන්ත්‍රක රථවාහන තත්ත්ව ක්ෂේත්‍රයේ NVQ7 තලයේ අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**සහ**

**සේවා ස්ථානය :** ලංකා ලුණු සමාගම ප්‍රධාන කාර්යාලය - හම්බන්තොට

**වැටුප් පරිමාණය :** JM1-1 2016 රුපියල් (42,600 -10X755+ 18X1,135= 70,580/=)

**වැටුප් තලය :** රුපියල් 42,600/=

**වයස් සීමාව :** අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල, මණ්ඩලවල හා අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නැත.

## කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන - MA 1-2

**රැකියා විස්තරය ප්‍රධාන වගකීම් ක්ෂේත්‍ර :**

තමන්ගේ ආසන්නතම සුපර්වයිසර්වරු හා අනෙකුත් නිලධාරීන්හට ආංශික කළමනාකරුවන්හට ඵලදායී ලෙස තම රාජකාරිවල කාර්යසාධනය සඳහා සහාය වෙමින් හා පවරා අති අංශයට අදාළ සියලු ලේඛන වාර්තා හා අනෙකුත් අවශ්‍යතා පවත්වාගත යුතුය. එසේම පවත්නා නීති හා රෙගුලාසි ප්‍රතිපත්ති හා චක්‍රලේඛ ප්‍රකාරව සියලු ක්‍රියාකාරකම් පරිගණකගතව හෝ අවශ්‍ය ආකාරයට සිදුකළ යුතුය. තවද, අදාළ දෙපාර්තමේන්තු හෝ අංශ ප්‍රධානී විසින් වරින්වර පවරනු ලබන රාජකාරී ඔවුන්ගේ උපදෙස් මත සිදුකළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අ.පො.ස (සා/ පෙළ) විභාගය, භාෂාව (සිංහල/ දෙමළ) හා ගණිතය විෂයන් ඇතුළත්ව සම්මාන හතරක් (04) සමග විෂයයන් හයකින් (06), එක් වරකදී සමත්ව සිටීම,**

**සහ**

අ.පො.ස (උ/ පෙළ) විභාගය (පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) විෂයයන් තුනකින් සමත් වීම.

**හෝ**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම් සහිත, ප්‍රාථමික තලයේ - පුහුණු, අර්ධ පුහුණු හා ප්‍රාථමික තලයේ නුපුහුණු වර්ගීකරණයන්ගේ සේවකයන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

- අ.පො.ස. (සා/ පෙළ) විභාගය, භාෂාව (සිංහල/ දෙමළ) හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම.

**සහ**

- ඉහත සේවක වර්ගීකරණයන් යටතේ ස්ථිර තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**සේවා ස්ථානය :** ලංකා ලුණු සමාගම, සේවා ලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ.

**වැටුප් පරිමාණය :** MA 1-2 රුපියල් (27,910-10X300+7X 350+12X600+12X710=49,080/=)

**වැටුප් තලය :** රුපියල් 27,910/=

**වයස් සීමාව :** අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය අංශයේ රාජ්‍ය සංස්ථාවල, මණ්ඩලවල හා අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නැත.

කරුණාකර, සම්පූර්ණ ජීවදත්ත සහිතව, ඥාති නොවන නිර්දේශයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයේ හා ඇමතුම් අංක සමග වූ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, 2023 ජූනි 16 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලු කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

මෙම තනතුර පිරවීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති, ලංකා ලුණු සමාගම,**
**මහලේවාය, හම්බන්තොට.**
**දුරකථනය - 047-2037305**